# ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ රාජ්‍ය වියදම් පිළිබඳ විමසුමක් (1998-2009); ප්‍රවණතා සහ මතුවන ගැටළු

ටෙරන්ස් අබේසේකර

එම්.ඩබ්.ඒ.සී.එස්. විජේතුංග

**සංක්ෂේපය**

රාජ්‍ය වියදම් විමසුමක් යනු, බොහෝ රටවල රාජ්‍ය අංශයට අයත් වියදම්වල මූලික ප්‍රතිඵල හා ප්‍රවණතාවයන් පිළිබද ව හඳුනා ගැනීමටත්, විශ්ලේෂණය කිරීමටත් පොදුවේ යොදා ගනු ලබන ක්‍රමවේදයකි. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට අයත් ආහාර බෝග, වැවිලි බෝග, ධීවර සහ පශු සම්පත් යන උප අංශයන්ට අදාළ වන රාජ්‍ය වියදම් පිළිබද ව මෙම ලිපිය මඟින් අවධානය යොමු කර ඇත.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය සඳහා රටේ සමස්ත වාර්ෂික රාජ්‍ය වියදමෙන් 4% ක් පමණ යෙදවෙන බව අධ්‍යයනය මඟින් අනාවරණය විය. කෘෂිකාර්මික අංශය සඳහා වැයවන වියදමෙන් වැඩිම ප්‍රමාණයක් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා යෙදවෙන අතර, එම අමාත්‍යාංශයට අදාළ ප්‍රතිපාදනවලින් වැඩි ප්‍රමාණයක් (එනම්, වර්ෂයකට රුපියල් බිලියන 30 ක් හෙවත් කෘෂිකාර්මික අංශයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 4.9%) වැය වනුයේ වී පොහොර සහනාධාරය ක්‍රියාත්මක කිරීම වෙනුවෙනි. මෙම සහනාධාරය සඳහා රජය වැය කරන මුදල මුළු පොහොර ආනයනය සඳහා වැය වන වියදමෙන් 95% ක් පමණ වන හෙයින් එහි මූල්‍ය තිරසාරත්වය පිළිබඳ ව ප්‍රධාන වශයෙන් අවධානය යොමු විය යුතු ය. දේශීය කෘෂිකාර්මික අංශය සඳහා වන රාජ්‍ය ප්‍රතිපාදනවල ඌනතාවයක් ඇති බව පොදු පිළිගැනීම වන නමුත්, මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව පෙනී යන්නේ, එම අංශයට අයත් බොහෝ අමාත්‍යාංශ හා ආයතන විසින් අදාළ වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල්වත් වසර අවසන් වන විට වියදම් කිරීමට අසමත් ව ඇති බව යි. මෙම ගැටළුව වඩාත් තීව්‍ර වනුයේ ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙනි. මෙමඟින් පැහැදිලි වනුයේ, කාර්යක්ෂම සංවර්ධන යෝජනා ක්‍රම හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර ධාරිතාවයේ පවතින දුර්වලතාවය යි.

රාජ්‍ය වියදම් ක්‍රියාදාමයේ කාර්යක්ෂමතාවය බිඳ වැටීමට හේතු කිහිපයක් මෙම අධ්‍යයනය තුළින් හඳුනා ගත හැකි ය. රාජ්‍ය වියදම් ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා විධිමත් නීතිරීති මාලාවක් හා ක්‍රියාදාමයක් පැවතෙන නමුත් ඒවා ඉහළ මට්ටම්වල දී පමණක් ඉතා ප්‍රබල ව ක්‍රියාත්මක වන අතර, පහළ මට්ටම්වල දී ක්‍රියාත්මක වීම දුර්වල තත්ත්වයක තිබීම එක් හේතුවකි. තව ද කෘෂිකාර්මික අංශයට අයත් ප්‍රධාන සංවර්ධන යෝජනා ක්‍රම පශ්චාත්කාලීන ව ක්‍රමික ව ඇගයීම සඳහා වන ආයතන නිසි අන්දමින් ක්‍රියා නො කිරීම, කෘෂිකර්ම අංශය තුළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ ගණනාවක් තිබීම, එම අමාත්‍යාංශවල විෂයපථයන් හා වගකීම් නිරතුරුව වෙනස්වීම් හා මෙම අංශය තුළ පැහැදිලි, ස්ථාවර, සහ දීර්ඝකාලීන ප්‍රතිපත්තියක් නොමැති වීම, රාජ්‍ය වියදම් වැඩසටහන්වල කාර්යක්ෂමතාව දුර්වලවීමට හේතු වේ. එසේ ම මෙම අංශයේ සංවර්ධනය තීරණය කෙරෙනුයේ සත්‍ය ප්‍රතිඵල මත නොව වියදම් කරන ලද මුදල් ප්‍රමාණය මත පමණක් වීමත්, ඒ සඳහා වගවීමක් නො තිබීමත් ගැටළුවක් වේ.

---

Sri Lanka Journal of Agrarian Studies 14 වෙළුම 1 කලාපයෙ හි පළ වූ "A Review of Public Expenditure in Agriculture Sector in Sri Lanka (1998-2009): Trends and Emerging Issues." නම් ලිපියෙ හි සිංහල පරිවර්තනයකි.

## 1. හැඳින්වීම

කෘෂිකාර්මික අංශය, ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ඉතා වැදගත් මෙහෙවරක් ඉටු කරන අතර, ඉංග්‍රීසි ආධිපත්‍යයෙන් මිදුණු යුගයේ සිට බලයට පත්වූ සෑම රජයක් විසින් ම දේශීය කෘෂි නිෂ්පාදන අංශය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මෙන් ම, විශාල වශයෙන් රාජ්‍ය අරමුදල් ලබා දීම හරහා ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහාත් ප්‍රධාන වශයෙන් කටයුතු කර තිබේ. මේ අතර සංවර්ධන හා වාරිමාර්ග යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, යටිතල පහසුකම් සැපයීම, වියළි කලාපය ආශ්‍රිත ව මහා පරිමාණ ජනාවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන් ක්‍රියාත්මක කිරීම හා ගොවීන් දැනුවත් කිරීම, නිෂ්පාදන මිල දී ගැනීම හා වෙළෙඳ ආයතන බිහිකිරීම, ගොවීන්ට බීජ, රෝපණ ද්‍රව්‍ය හා පොහොර සැපයීම සඳහා ද රාජ්‍ය මැදිහත්වීම ලැබී තිබේ. තව ද නිෂ්පාදන දිරි ගැන්වීම, ගොවීන්ගේ ප්‍රතිලාභ ඉහළ නැංවීම සඳහා පොහොර සහනාධාරය ලබාදීම සහ වෙනත් සාම්ප්‍රදායික නො වන සෘජු හා වක්‍ර සහනාධාර ක්‍රම හඳුන්වාදීම මඟින් ගොවි ජනතාවට සහාය වීම සඳහා රාජ්‍ය අංශයේ සහයෝගය ලබා දීම සිදුවිය.

මෙලෙස රාජ්‍ය මැදිහත්වීම් හා දිරිගැන්වීම් විශාල වශයෙන් සිදු කරනු ලැබුව ද පොදුවේ සැලකූ විට මේ දක්වා ම ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය, බලාපොරොත්තු වූ ප්‍රතිඵල ළඟා කරගැනීමට අසමත් ව ඇත. ආහාර බෝග නිෂ්පාදන අංශය සැලකූ විට ආහාර ස්වයංපෝෂිතාවය ජනප්‍රිය සංවර්ධන මාතෘකාවක් බවට පත් වී ඇතත්, මේ වනතුරු එම ඉලක්කය වෙත ළඟාවීමට අසීරු ව තිබේ. දශක පහකට වඩා වැඩි කාලයක් මුළුල්ලේ මේ සඳහා වෑයම් කර ඇතත්, ශ්‍රී ලංකාවට මේ දක්වා ම ආහාර ආනයනය මත යැපීමට සිදු ව තිබේ. එසේ ම ආහාර අංශයේ ප්‍රගතිය, කාලගුණ වෙනස්වීම් මත රඳී පවතී. 2009 වර්ෂය තුළ ආහාර ආනයන වියදම සැලකූ විට, සහල් සඳහා රුපියල් මිලියන 2,616 ක් ද, තිරිඟු පිටි සඳහා රුපියල් මිලියන 195 ක් ද, ලූනු, මිරිස්, ධාන්‍ය, පරිප්පු සහ අර්තාපල් ඇතුළු අනෙකුත් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා රුපියල් මිලියන 19,013 ක් ද වැය වී ඇත (මහ බැංකු වාර්ෂික වාර්තා, 2009).

පසුගිය කාලය තුළ බලයට පත් වූ සෑම රජයක් ම කෘෂිකර්මය නංවාලීමට විශේෂයෙන් ම දේශීය බෝග නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා විශාල වශයෙන් සම්පත් යොදවන ලදී. කෙසේ වූව ද මේ දක්වා ම කෘෂි අංශයේ රාජ්‍ය වියදම් පිළිබඳ ව විස්තරාත්මක ව ඇගයීමක් සිදු කර නැති අතර, එවැන්නක් සිදුකිරීම ප්‍රතිපත්ති සම්පාදකයින්ට ද වැදගත් වේ. එවැනි උත්සාහයක් දැරීම මඟින්, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විවිධ උප අංශවලට කොපමණ රාජ්‍ය අරමුදල් ප්‍රමාණයක් යොදවා තිබේ ද යන්න හඳුනා ගැනීමටත්, වියදම් පිළිබඳ ව සැලකීමේ දී මෙම අංශයේ ඌන වර්ධනය සඳහා බලපාන ප්‍රධාන ගැටළු හඳුනා ගැනීමටත් උපකාරී වේ. එම නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය අංශය විසින් දරන ලද වියදම් හා එහි සංයුතිය පිළිබඳ ව සොයා බැලීමත්, මේ සම්බන්ධයෙන් බලපාන රාජ්‍ය අයවැය ක්‍රියාදාමය පිළිබඳ ව කරුණු සොයා බැලීමත් මෙම ලිපිය මඟින් අපේක්ෂා කෙරේ.

## 2. අධ්‍යයනයේ අරමුණු

මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වනුයේ, කෘෂිකාර්මික අංශය සඳහා විශේෂයෙන් ම ආහාර බෝග වගාව (වී හා අනෙකුත් ක්ෂේත්‍ර බෝග) සඳහා අයවැයෙන් වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණය, එහි සංයුතිය හා සත්‍ය වශයෙන් යොදවන ලද රාජ්‍ය වියදම් පිළිබඳ ව විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කිරීමත්, අයවැය සැකසීම හා ක්‍රියාත්මක කිරීම හරහා මතුවන ප්‍රධාන ගැටළු පිළිබඳ ව සොයා බැලීමත් ය.

මෙම අධ්‍යයනයේ විශේෂිත අරමුණු වනුයේ;

01. කෘෂිකාර්මික අංශය සඳහා වාර්ෂික ව අයවැය මඟින් ඇස්තමේන්තු කරන රාජ්‍ය මුදල් ප්‍රමාණය පිළිබඳ ව සොයා බැලීම හා විශ්ලේෂණය කිරීම.

02. කෘෂිකාර්මික අංශය සඳහා සත්‍ය වශයෙන් වියදම් කරනු ලබන මුදල් ප්‍රමාණය පිළිබඳ ව සොයා බැලීමත් අයවැය කළමනාකරණය හා යෙදවීම කෙරෙහි බලපාන ප්‍රතිපත්තිමය ගැටළු පිළිබඳ විමර්ශනය කිරීමත් ය.

මෙහි දී රජය විසින් කෘෂිකාර්මික අංශයේ විවිධ කටයුතු සඳහා වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණයන් පිළිබඳ ව සොයා බැලීමක් කරනු ලබන අතර, ඒ කුමන අරමුණු සඳහා ද, කුමන ආයතන සඳහා ද යන්නත් සත්‍ය වශයෙන් කොපමණ මුදලක් වියදම් කරන්නේ ද යන්නත් සලකා බලයි. තව ද අයවැය ක්‍රියාදාමයේ මූලික කරුණු පිළිබඳ ව සොයා බැලීමත්, එහි දී මතුවන ගැටළු සඳහා පිළියම් ඉදිරිපත් කිරීමත් අපේක්ෂිත ය.

## 3. ක්‍රමවේදය හා විෂය පථය

කෘෂිකාර්මික අංශයට අදාළ සියළු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා ඇස්තමේන්තු කරන ලද හා සත්‍ය වශයෙන් දරන ලද රාජ්‍ය වියදම් මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට අයත් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂික ව ප්‍රකාශයට පත් කරනු ලබන වාර්තාවල සඳහන් වියදම් දත්ත මේ සඳහා යොදා ගැනිණි. වර්ෂ 1998 සිට 2009 දක්වා වූ රාජ්‍ය වියදම් මෙහි දී විශ්ලේෂණය කරන ලද අතර, මීට අමතර ව අයවැය සැකසීමේ ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රධාන නිලධාරීන් කිහිපදෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මඟින් ද තොරතුරු රැස් කරගන්නා ලදී.

මෙහි දී කෘෂිකාර්මික ක්ෂේත්‍රය ලෙස විග්‍රහ කරනු ලබන්නේ ආහාර බෝග (වී සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග), වැවිලි බෝග, ධීවර හා පශු සම්පත් යන අංශවලට අයත් සියළු ම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යි. වන හා වන ජීවී අමාත්‍යාංශයට අදාළ වියදම් මෙම අධ්‍යයනයට ඇතුළත් නොවේ.

### ලිපියේ සංවිධානය

මෙහි දී ප්‍රධාන කොටස් හතරක් යටතේ අධ්‍යයනයේ සොයා ගැනීම් විස්තර කෙරේ. ඒ අනුව, ප්‍රථමයෙන් කෘෂිකාර්මික අංශයට අදාළ සත්‍ය රාජ්‍ය වියදම්, එහි සංයුතිය හා ප්‍රවණතාවයත්, දෙවනුව කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ ව ආහාර බෝග (වී හා අනෙකුත් ක්ෂේත්‍ර බෝග) නිෂ්පාදනයට අදාළ වියදම් පිළිබඳ වත් අනතුරු ව අයවැය ක්‍රියාවලිය එනම්, අයවැය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව ඇගයීමත්, ඒ අනුව රාජ්‍ය අයවැය වැඩසටහනේ කාර්යක්ෂමතාව දුර්වල කිරීමට බලපාන මූලික කරුණු විස්තර කිරීමත් සිදු කෙරේ. අවසානයේ මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් ඉදිරිපත් කිරීම හා රාජ්‍ය වියදම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා ගත හැකි පියවරයත් ඉදිරිපත් කිරීමත් සිදු වේ.

## 4. කෘෂිකාර්මික අංශය සඳහා වැයවන රාජ්‍ය වියදම

මෙහි දී කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආහාර බෝග, වැවිලි බෝග, ධීවර හා පශු සම්පත් යන උප අංශවලට අදාළ ව වැය කරනු ලබන රාජ්‍ය වියදම් පිළිබඳ ව විස්තරාත්මක විග්‍රහයක් කිරීමට බලාපොරොත්තු වේ. මෙය ප්‍රධාන කොටස් 5 ක් ඔස්සේ විස්තර වේ. එනම්, කෘෂිකාර්මික අංශය සඳහා යෙදවෙන සමස්ත වාර්ෂික රාජ්‍ය වියදම හා එහි ප්‍රවණතා, වියදම් සංයුතිය, කෘෂි

ප්‍රමාණයත්, කෘෂිකාර්මික අංශයේ ප්‍රධාන උප අංශයන්ට අදාළ ව වෙන් කරනු ලබන හා වියදම් කරන ලද මුදල් ප්‍රමාණයත් සහ එක් එක් උප අංශයන්ට අදාළ ව අමාත්‍යාංශවලට වෙන් කරනු ලබන සහ වියදම් කළ මුදල් ප්‍රමාණයත් ය.

## 4.1 කෘෂිකාර්මික අංශයේ රාජ්‍ය වියදම : සමස්ත විග්‍රහයක්

මෙම අධ්‍යයනය මඟින් හෙළිදරව් වන පරිදි රජය විසින් කෘෂි අංශය සඳහා සත්‍ය වශයෙන් ම වියදම් කරන ලද මුදල් ප්‍රමාණය එමඟින් අපේක්ෂිත ප්‍රතිඵලයට වඩා, විශේෂයෙන් ම රටේ තිරසාර ආහාර සුරක්ෂිතතාවය හා දුප්පත්කම තුරන් කිරීම සඳහා වන ජීවන මාර්ගයක් ලෙස කෘෂි අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලයට වඩා අඩු ප්‍රමාණයකි. තව ද ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය සඳහා යොදවන රාජ්‍ය අරමුදල්, වී හා අනෙකුත් ආහාර බෝග, වැවිලි බෝග, සුළු අපනයන බෝග, පශු සම්පත් හා ධීවර යන සියළු අංශ තුළ ම කේන්ද්‍රගත වී ඇත. කෘෂි අංශය සඳහා රාජ්‍ය අරමුදල් අඩු ප්‍රමාණයක් ආයෝජනය කර තිබීම විශේෂයෙන් ම අවධානයට ලක් කළ යුත්තකි.

වාර්ෂික වර්ධනය සැලකූ විට, කෘෂිකාර්මික අංශය මිශ්‍ර ප්‍රතිඵල පෙන්වා තිබේ (වගු අංක 1). 1999-2009 කාල වකවානුව තුළ දේශීය ආහාර නිෂ්පාදන අංශය දුර්වල වර්ධනයක් පෙන්වා ඇති අතර, සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය වර්ෂයකට 2% ක් පමණ වේ. බොහෝ වර්ෂයන් හි දී ආහාර බෝග අංශයේ සෘණ වර්ධනයක් පෙන්නුම් කරන අතර, එම ක්ෂේත්‍රයේ පවතින දැඩි අනාරක්ෂිත බව, දේශගුණ සහ අනෙකුත් බලපෑම් මත සිදුවන අස්ථාවරත්වය ද මෙයට හේතු වේ.

වගු අංක 1

**ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට අයත් විවිධ උප අංශයන් හි තෝරා ගන්නා ලද වර්ෂවල දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය (1999-2009)**

| උප අංශය | වාර්ෂික වර්ධනය (%) | | | සාමාන්‍ය (%) |
|---|---|---|---|---|
| | 1999 | 2004 | 2009 | 1999-2009 |
| ආහාර බෝග | 13.7 | -2.8 | -1.3 | 3.1 |
| ධීවර | -1.1 | 2.1 | 10.8 | 7.3 |
| පශු සම්පත් | 11.9 | 12.8 | 7.8 | 5.0 |
| වැවිලි | 6.1 | 0.1 | -16.2 | 1.7 |
| සමස්ත | 4.4 | 0 | -2.5 | 2.2 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තා.

සමස්ත වශයෙන් ලෙස සැලකූ විට, 1998-2009 කාල පරිච්ඡේදය තුළ දී කෘෂි අංශය සඳහා යොදවන ලද අරමුදල් ප්‍රමාණය අඩු මට්ටමක පවතින අතර, එය මුළු රාජ්‍ය වියදමෙන් 4.3% ක් පමණ වේ (වගු අංක 2). ඉහළ ම මුදල් ප්‍රමාණයක් එනම්, මුළු රාජ්‍ය වියදමෙන් 4.7% ක් වැය කර ඇත්තේ 1999 දී වන අතර අවම ප්‍රමාණයක් එනම්, 3.1% ක් 2007 වර්ෂයේ දී වියදම් කර ඇත. මෙසේ මුළු රාජ්‍ය වියදමට සාපේක්ෂ ව කෘෂි අංශය සඳහා යොදවනු ලබන රාජ්‍ය වියදම අඩුවීම, රටේ සමස්ත ආර්ථිකය සමඟ සන්සන්දනය කිරීමේ දී කෘෂි අංශයේ සංවර්ධනය පිළිබඳ ව ගැටළු ගණනාවක් මතු කරයි.

වගු අංක 2

**ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ රාජ්‍ය වියදම (1998-2009)**

| වර්ෂය | කෘෂි අංශය සඳහා වැයකළ රාජ්‍ය වියදම (රු. බිලියන) | මුළු රාජ්‍ය වියදම (රු. බිලියන) | මුළු රාජ්‍ය වියදමට සාපේක්ෂ ව කෘෂි අංශය සඳහා වැය කළ රාජ්‍ය වියදම (%) |
|---|---|---|---|
| 1998 | 11.9 | 268 | 4.4 |
| 1999 | 13.2 | 279 | 4.7 |
| 2000 | 13.5 | 336 | 4.0 |
| 2001 | 15.1 | 386 | 3.9 |
| 2002 | 13.6 | 403 | 3.4 |
| 2003 | 15.1 | 418 | 3.6 |
| 2004 | 16.6 | 477 | 3.4 |
| 2005 | 24.6 | 585 | 4.2 |
| 2006 | 31.1 | 714 | 4.3 |
| 2007 | 37.4 | 1,194 | 3.1 |
| 2008 | 64.0 | 1,552 | 4.1 |
| 2009 | 73.1 | 1,719 | 4.2 |
| වාර්ෂික සාමාන්‍යය | 27.4 | 694 | 4.3 |

සටහන : වියදම් රුපියලේ වත්මන් අගය අනුව යි.

කෘෂිකර්ම, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන, වැවිලි කර්මාන්ත, ධීවර හා ජලජ සම්පත්, කෘෂි සංවර්ධන හා ගොවිජන සේවා, වාරිමාර්ග හා සත්ව නිෂ්පාදන අමාත්‍යාංශවල වියදම් මෙයට ඇතුළත් වේ.

මූලාශ්‍රය : වාර්ෂික අයවැය ඇස්තමේන්තු වාර්තා, (1998-2000).

මෙම විශ්ලේෂණය මඟින් පෙන්නුම් කරන පරිදි 1998 සිට 2009 කාලපරිච්ඡේදය තුළ කෘෂිකාර්මික අංශයේ රාජ්‍ය වියදම නාමික අගය මත රුපියල් බිලියන 12 සිට රුපියල් බිලියන 73 දක්වා ඉහළ ගොස් ඇත. කෘෂි අංශය සඳහා වන රාජ්‍ය වියදම කෘෂි දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට 1998-2004 අතර කාලපරිච්ඡේදය තුළ දී වර්ෂයකට 6% ක් පමණ වන අගයක් තුළ විචලනය වී තිබේ. 1998 සිට 2009 දක්වා කාලය තුළ මෙම ප්‍රතිශතය 6%- 8% (1998) සිට 2009 දී 12% තෙක් ඉහළ ගොස් ඇත (වගු අංක 3).

වගු අංක 3

**කෘෂිකාර්මික අංශයේ රාජ්‍ය වියදම් සහ**
**කෘෂිකාර්මික අංශයේ දළ දේශීය නිෂ්පාදිතය (1998-2009)**

| වර්ෂය | කෘෂිකාර්මික අංශයේ මූළු රාජ්‍ය වියදම (රු.මිලියන) | | කෘෂිකාර්මික අංශයේ දළ දේශීය නිෂ්පාදනය (රු.මිලියන) | | කෘෂිකාර්මික අංශයේ රාජ්‍ය වියදම කෘෂිකාර්මික අංශයේ ද.දේ.නි. යේ (%) ක් ලෙස |
|---|---|---|---|---|---|
| | නාමික අගය | සත්‍ය අගය | නාමික අගය | සත්‍ය අගය | |
| 1998 | 11,894 | 11,894 | 175,479 | 175,479 | 6.8 |
| 1999 | 13,222 | 12,653 | 191,577 | 183,329 | 6.9 |
| 2000 | 13,517 | 12,127 | 200,963 | 180,300 | 6.7 |
| 2001 | 15,171 | 12,108 | 214,483 | 171,180 | 7.1 |
| 2002 | 13,621 | 10,028 | 233,615 | 171,999 | 5.8 |
| 2003 | 15,149 | 10,610 | 241,122 | 168,871 | 6.2 |
| 2004 | 16,651 | 10,719 | 262,271 | 168,828 | 6.3 |
| 2005 | 24,575 | 14,324 | 289,906 | 168,980 | 8.4 |
| 2006 | 31,133 | 16,307 | 333,137 | 174,493 | 9.3 |
| 2007 | 37,426 | 17,195 | 418,104 | 192,093 | 9.0 |
| 2008 | 63,968 | 25,261 | 590,114 | 233,039 | 10.8 |
| 2009 | 73,167 | 27,353 | 607,788 | 227,221 | 12.0 |

මූලාශ්‍රය: ජාතික අයවැය ඇස්තමේන්තු වාර්තා, (1998-2009).

## 4.2 කෘෂිකාර්මික අංශය තුළ වර්තන හා ප්‍රාග්ධන වියදම් යෙදවීම

රාජ්‍ය වියදම වර්තන හා ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කළ හැකි අතර, පසුගිය වර්ෂවල කෘෂි අංශයේ රාජ්‍ය වියදම්වල ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ වර්තන වියදම්වල ඉහළ යෑම යි (වගු අංක 4). වර්තන වියදම් සැලකූ විට, රජයේ සේවක වැටුප් සඳහාත්, යෙදවුම් මත සහනාධාර සැපයීම සඳහාත් (ප්‍රධාන වශයෙන් පොහොර සඳහා) රජය විශාල වශයෙන් මුදල් වියදම් කරයි. වැටුප් හා අනෙකුත් ඒ සම්බන්ධ වියදම් සඳහා විශාල මුදලක් වැය කිරීම නිසා අයවැය මඟින් නව ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබාදීම අඩු බව පෙනී යයි.

වගු අංක 4

**නාමික අගය අනුව කෘෂිකාර්මික අංශයේ වර්තන හා ප්‍රාග්ධන වියදම**

| වර්ෂය | වර්තන වියදම (රු.මිලියන) | ප්‍රාග්ධන වියදම (රු.මිලියන) | වර්තන/ප්‍රාග්ධන අනුපාතය |
|---|---|---|---|
| 1998 | 5,629 | 6,265 | 0.9 |
| 1999 | 5,007 | 8,216 | 0.6 |
| 2000 | 5,624 | 7,891 | 0.7 |
| 2001 | 7,132 | 8,040 | 0.9 |
| 2002 | 6,964 | 6,655 | 1.0 |
| 2003 | 6,932 | 8,215 | 0.8 |
| 2004 | 8,894 | 7,757 | 1.1 |
| 2005 | 13,686 | 10,890 | 1.3 |
| 2006 | 19,356 | 11,778 | 1.6 |

මූලාශ්‍රය: ජාතික අයවැය ඇස්තමේන්තු වාර්තා, (1998-2009).

## 4.3 කෘෂි ක්ෂේත්‍රයේ ඇස්තමේන්තු වියදම් සහ සත්‍ය වියදම්

කෘෂිකර්ම අංශයට අයත් සියළු ම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සඳහා ඇස්තමේන්තු කරන ලද සහ සත්‍ය වශයෙන් වියදම් කරන ලද අරමුදල් පිළිබඳ විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ ඇස්තමේන්තු කරන ලද මුදල් වියදම් කිරීම අඩු වී ඇති බව යි. වාර්ෂික ව අයවැය මඟින් ප්‍රතිපාදන ලෙස ඇස්තමේන්තු කරන මුදලට වඩා විශාල වශයෙන් අඩු මුදල් ප්‍රමාණයක් වසර අවසන් වන විට වියදම් කර තිබේ (වගු අංක 5). මෙහි ප්‍රතිශතය 40% (2007) සිට 34% (2008) හා 30% (2009) ලෙස දැක්වේ. කෘෂිකර්ම, ගොවිජන සේවා හා පශු සම්පත් යන අමාත්‍යාංශ සඳහා මෙසේ ඇස්තමේන්තු කරන ලද ප්‍රමාණයට වඩා අඩුවෙන් මුදල් වියදම් කර ඇත.

වගු අංක 5 මඟින් පෙන්නුම් කරන පරිදි, කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා අයවැය මඟින් ප්‍රාග්ධන වියදම් වශයෙන් වසර මුල දී ඇස්තමේන්තු කරන ලද මුදලට වඩා අඩුවෙන් වියදම් කරන ලද මුදල් ප්‍රමාණය 40% ක් පමණ වේ. මෙසේ ඇස්තමේන්තු කළ මුදල හා වර්ෂය අවසානයේ දී සත්‍ය වශයෙන් වියදම් කරන ලද මුදල් ප්‍රමාණය අතර විශාල පරතරයක් දක්නට ලැබීම අරමුදල් භාවිතයේ කාර්යක්ෂමතාව පිළිබඳ ව ගැටළු මතු කරවන්නකි. මෙය වඩා තීව්‍ර වන්නේ ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙනි. ඉඩම් අත්පත් කරගැනීම හා ටෙන්ඩර් කැඳවීම් වැනි ක්‍රියාදාමයන්ට අදාළ ව මෙසේ නිරන්තර ව අයවැය අරමුදල් අඩුවෙන් වියදම් කිරීම දක්නට ලැබේ. මෙයින් හැඟී යන්නේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් ඔවුන්ගේ අවශ්‍යතාවයට වඩා වැඩි ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු සකස් කර, අයවැය වාර්තා සැකසීම සඳහා භාණ්ඩාගාරය වෙත යවන බවත්, වර්ෂය අවසානය වන විට එම අරමුදල් වියදම් කිරීමට නො හැකි වී ඇති බවත්, අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නො හැකි වී ඇති බවත් ය. ප්‍රමාණවත් සැලසුම්කරණයක් හා ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ පෙර සූදානමක් නො තිබීම මෙයට හේතු වේ.

වගු අංක 5

**කෘෂිකර්ම ක්ෂේත්‍රයට අයත් ඇතැම් අමාත්‍යාංශ සඳහා ඇස්තමේන්තුගත හා සත්‍ය වශයෙන් වියදම් කළ රාජ්‍ය අරමුදල් (2007-2009)**

| අමාත්‍යාංශය | වර්තන වියදම් | | | ප්‍රාග්ධන වියදම් | | |
|---|---|---|---|---|---|---|
| | අනුමත (රු.මිලියන) | සත්‍ය (රු.මිලියන) | වැඩි (+) හෝ අඩු (-) භාවිතය (%) | අනුමත (රු.මිලියන) | සත්‍ය (රු.මිලියන) | වැඩි (+) හෝ අඩු (-) භාවිතය (%) |
| **2007** | | | | | | |
| කෘෂිකර්ම සංවර්ධන | 14,558 | 14,651 | 0.6 | 4,401 | 2,638 | -40.1 |
| ගොවිජන සේවා හා ගොවිකටයුතු සංවර්ධනය | 2,526 | 2,474 | -2.1 | 3,370 | 794 | -76.4 |
| කෘෂිකර්ම, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන | 1,572 | 1,572 | 0.0 | 4,324 | 3,989 | -7.7 |
| ධීවර හා ජලජ සම්පත් | 749 | 744 | -0.7 | 5,946 | 3,399 | -42.8 |
| පශු සම්පත් හා යටිතල පහසුකම් සංවර්ධන | 334 | 310 | -7.3 | 684 | 541 | -20.9 |
| **එකතුව** | **19,739** | **19,751** | **0.1** | **18,756** | **11,358** | **-39.4** |
| **2008** | | | | | | |
| කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා | 33,661 | 33,022 | -1.9 | 10,826 | 6,660 | -39.0 |
| වැවිලි කර්මාන්ත | 1,543 | 1,415 | -8.3 | 3,644 | 2,601 | -28.6 |
| ධීවර හා ජලජ සම්පත් | 856 | 831 | -2.9 | 4,184 | 3,847 | -8.0 |
| පශු සම්පත් සංවර්ධන | 368 | 333 | -9.4 | 697 | 383 | -45.0 |
| වාරිමාර්ග හා ජල කළමනාකරණ | 1,243 | 1,263 | 1.6 | 5,020 | 2,700 | -46.2 |
| **එකතුව** | **37,671** | **36,864** | **-2.1** | **24,371** | **16,191** | **-33.6** |
| **2009** | | | | | | |
| කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා | 35,317 | 34,276 | -2.9 | 11,035 | 4,764 | -56.8 |
| වැවිලි කර්මාන්ත | 1,709 | 1,599 | -6.4 | 3,296 | 2,124 | -35.6 |
| ධීවර හා ජලජ සම්පත් | 971 | 937 | -3.5 | 6,685 | 6,819 | 2.0 |
| පශු සම්පත් සංවර්ධන | 402 | 361 | -10.0 | 960 | 319 | -66.8 |
| වාරිමාර්ග හා ජල කළමනාකරණ | 1,340 | 1,295 | -3.4 | 10,813 | 9,457 | -12.5 |
| **එකතුව** | **39,739** | **38,468** | **-3.2** | **32,789** | **23,483** | **-28.4** |

සටහන : අමාත්‍යාංශ ලැයිස්තු 2007,2008,2009 වර්ෂවල අයවැය වාර්තා මත පදනම් වේ.
මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, (2008- 2009). මුදල් හා සැලසුම් අමාත්‍යාංශ වාර්තා සහ වාර්ෂික වාර්තා.

## 4.4 කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විවිධ අංශ සඳහා අරමුදල් යෙදවීම

වගු අංක 6 මඟින් පෙන්වන පරිදි, කෘෂිකාර්මික අංශය සඳහා රාජ්‍ය අරමුදල් සැපයීමේ දී අවම ප්‍රමුඛත්වය දී ඇත්තේ පශු සම්පත් සංවර්ධනය සඳහා ය. මෙය කෘෂිකාර්මික අංශය සඳහා වන වියදමෙන් 1% ක් පමණ වේ. ශ්‍රී ලංකාවේ, කුකුළු ගොවිපොළ හා සූකර (ඌරු) කර්මාන්තය සඳහා සම්පූර්ණ දායකත්වය සැපයෙන්නේ පෞද්ගලික අංශය මඟින් නිසා පශු සම්පත් සංවර්ධනය

සඳහා වෙන් කරනු ලබන අරමුදල් වැඩි වශයෙන් යෙදවෙන්නේ කිරි ගොවිතැන නගාසිටුවීම සඳහා යි. මේ අනුව පැහැදිලි වන්නේ පශු සම්පත් සංවර්ධනය සඳහා අඩු ප්‍රමුඛත්වයක් ලබා දී ඇති බව යි. එම තත්ත්වය මත කෙටි කාලයක් තුළ දී කිරි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත කිරීමේ රජයේ අරමුණ වෙත ළඟා වීම පිළිබඳ ව පශු සම්පත් සංවර්ධන අංශයේ හා අමාත්‍යාංශයට අයත් සැලසුම් සකස් කරන අයගේ ප්‍රමුඛ අවධානය යොමු විය යුතු ය.

කෘෂි අංශය සඳහා, වාර්ෂික වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී මිළඟට අඩු අවධානයක් යොමු කර තිබෙන්නේ ධීවර හා වැවිලි බෝග යන අංශ සඳහා වන අතර, ඒ සඳහා කෘෂි අංශයට අදාළ මුළු රාජ්‍ය වියදමෙන් ලබා දී ඇත්තේ 10% ක් බැගින් පමණි. වැවිලි අංශයට අයත් වතු කළමනාකරණය සහ සංවර්ධනය කිරීම සඳහා වන වියදම් වර්තමානයේ පෞද්ගලික අංශය මඟින් දරනු ලැබේ. ඒ අනුව වතු අංශය සඳහා දරනු ලබන රාජ්‍ය වියදම අඩු වීම සාධාරණීකරණය කළ හැක.

කෙසේ වෙතත් ආහාර බෝග වගාව (වී හා අනෙකුත් ක්ෂේත්‍ර බෝග ඇතුළු ව) සඳහා කෘෂිකාර්මික අංශයේ මුළු රාජ්‍ය වියදමෙන් 80% ක් තරම් වන ඉහළ මුදල් ප්‍රමාණයක් වාර්ෂික ව වෙන් කරනු ලැබේ.

**වගු අංක 6**

**කෘෂිකර්ම අංශයේ විවිධ අංශ අනුව රාජ්‍ය වියදම (1998-2009)**

| වර්ෂය | ආහාර බෝග (රු.මිලියන) | ධීවර (රු.මිලියන) | වැවිලි බෝග (රු.මිලියන) | පශු (රු.මිලියන) | එකතුව (රු.මිලියන) |
|---|---|---|---|---|---|
| 1998 | 8,822 (74) | 885 (7) | 2,036 (17) | 151(1) | 11,894 (100) |
| 1999 | 8,679 (66) | 1,603 (12) | 2,755 (21) | 185 (1) | 13,222 (100) |
| 2000 | 9,089 (67) | 1,595 (12) | 2,674 (20) | 159 (1) | 13,517 (100) |
| 2001 | 10,966 (72) | 2,091 (14) | 1,957 (13) | 157 (1) | 15,171 (100) |
| 2002 | 11,075 (81) | 1,112 (8) | 1,318 (10) | 116 (1) | 13,621 (100) |
| 2003 | 11,806 (78) | 2,022 (13) | 1,113 (7) | 208 (1) | 15,149 (100) |
| 2004 | 13,873 (83) | 1,231 (7) | 1,307 (8) | 240 (1) | 16,651 (100) |
| 2005 | 18,990 (77) | 3,884 (13) | 1,310 (5) | 391 (1) | 24,575 (100) |
| 2006 | 25,324 (81) | 3,926 (13) | 1,447 (5) | 436 (1) | 31,133 (100) |
| 2007 | 29,149 (78) | 4,143 (11) | 3,437 (9) | 697 (2) | 37,426 (100) |
| 2008 | 52,607 (82) | 5,216 (8) | 5,067 (8) | 1,078 (2) | 63,968 (100) |
| 2009 | 59,144 (81) | 7,656 (10) | 5,005 (7) | 1,362 (2) | 73,167 (100) |
| වාර්ෂික සාමාන්‍යය | 21,627 (77) | 2,947 (11) | 2,452 (11) | 432 (1) | 27,458 (100) |

මූලාශ්‍රය : වාර්ෂික අයවැය ඇස්තමේන්තු වාර්තා, (1998-2009).

## 4.5 කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විවිධ අමාත්‍යාංශ සඳහා වැය කළ රාජ්‍ය වියදම

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ එය අමාත්‍යාංශ විශාල සංඛ්‍යාවක් යටතේ ක්‍රියාත්මක වීම යි (2006 දී අමාත්‍යාංශ 7 කි). මෙම අමාත්‍යාංශවල නිරතුරු ව සිදුවන වෙනස්වීම් මෙන් ම ඒවායේ කාර්යභාරය, වගකීම් සහ විෂය පථයේ සිදුවන වෙනස්කම්, මෙම අංශයට අදාළ අමාත්‍යාංශවල ක්‍රියාකාරිත්වය සුමට ව පවත්වාගෙන යාමට බාධකයක් වී තිබේ. මෙසේ වරින්වර අමාත්‍යාංශවල සිදුවන වෙනස්වීම්, ඒවායේ වගකීම්

අතිපිහිත (overlap) වීමටත්, වගකීම් පිළිබඳ ගැටළු මතුවීමටත් හේතු වේ. මෙම තත්ත්වය අමාත්‍යාංශවල වැඩකටයුතුවල අවුල්සහගත ස්වාභාවයක් ඇති වීමටත්, මෙම අංශයට අයත් විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන අතර සම්බන්ධීකරණය දුර්වල වීමටත් හේතු වේ.

## 5. කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා වැය කළ රාජ්‍ය වියදම්

කෘෂිකර්ම ක්ෂේත්‍රයට අයත් රාජ්‍ය වියදම් පිළිබඳ විමර්ශනය කිරීමේ දී වැඩි ම මුදල් ප්‍රමාණයක් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා වැය වන බව පෙනී යයි. එම නිසා කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ ව ආහාර බෝග නිෂ්පාදනය සඳහා වැය කරනු ලබන රාජ්‍ය වියදම් පිළිබඳ ව විස්තරාත්මක විග්‍රහයක් කිරීමට මෙම කොටසේ දී බලාපොරොත්තු වේ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූලික අපේක්ෂාව වන්නේ දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම යි.

### 5.1 ප්‍රාග්ධන වියදම් සඳහා අඩු ප්‍රමුඛත්වයක් ලබාදීම

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් රාජ්‍ය වියදම් දත්ත විශ්ලේෂණයේ දී පෙනී යන්නේ, අමාත්‍යාංශ අයවැයෙන් වැඩි ප්‍රමාණයක් (75%)වර්තන වියදම් වෙනුවෙන් වැය කරන බව යි. මේ අනුව ප්‍රාග්ධන වියදම් සඳහා යෙදවෙන්නේ අමාත්‍යාංශයට අයත් රාජ්‍ය වියදමෙන් 1/4 පමණක් බැවින් අමාත්‍යාංශයේ සමස්ත වියදම්වල අසමතුලිතතාවයක් පවතී (වගු අංක 7). මෙසේ වර්තන හා ප්‍රාග්ධන වියදම් අතර පවතින අසමතුලිතතාවය කෘෂි අංශයේ වර්ධනය පිළිබඳ ව සැලකීමේ දී ප්‍රධාන වශයෙන් අවධානයට ලක්විය යුත්තකි. මෙහි දී ගබඩා පහසුකම් වැනි අත්‍යවශ්‍ය ප්‍රාග්ධන ආයෝජන සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නො තිබීම ආහාර බෝග අංශයේ දීර්ඝකාලීන සංවර්ධනය සඳහා අහිතකර ලෙස බලපායි.

### 5.2 වර්තන හා ප්‍රාග්ධන වියදම්වල අසමතුලිතතාවය

කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ වර්තන වියදම්වල ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන වැය ශීර්ෂය වන්නේ කාර්ය මණ්ඩල වැටුප් හා අනෙකුත් දීමනා, සහනාධාර පොහොර බෙදා හැරීම සහ අනෙකුත් සේවා සැපයීම සඳහා ප්‍රතිපාදන වශයෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණයන් ය. මෙම වර්තන වියදම, කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් මුළු වියදමෙන් 75% ක් තරම් වැඩි කොටසක් වන අතර, මේ නිසා වෙනත් ඵලදායී කටයුතු සඳහා යෙදවීමට ඇති මුදල ප්‍රමාණවත් නොවේ. වර්තන වියදම් පිළිබඳ ව සැලකීමේ දී ඉන් වැඩි ම ප්‍රමාණයක් වැය වන්නේ වී පොහොර සහනාධාරය ලබා දීම වෙනුවෙන් බව පෙනී යයි (මෙය කෘෂිකර්ම අමාත්‍යාංශයේ 1998-2006 කාලය තුළ දරන ලද මුළු වියදමෙන් 43% කි). එසේ ම සේවක වැටුප් හා අතිකාල දීමනා දෙවන ඉහළ ම වර්තන වියදම් වැය ශීර්ෂය වේ (22%). මෙම වැය ශීර්ෂ දෙක සඳහා පමණක් මුළු වර්තන වියදමෙන් 85% ක් පමණ වැය වන නිසා වෙනත් නව ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට ප්‍රමාණවත් තරම් මුදල් ප්‍රතිපාදන අමාත්‍යාංශය තුළ දක්නට නොමැත.

වගු අංක 7

**වර්තන හා ප්‍රාග්ධන වියදම් අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා වැය කළ මුදල් (1998-2006) - ප්‍රතිශතවලින්**

| අයිතමය | 1998 | 1999 | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | සාමාන්‍යය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම්** | | | | | | | | | | |
| වැටුප් | 10.8 | 16.3 | 24.8 | 26.8 | 32.7 | 34.0 | 18.7 | 17.4 | 14.8 | 21.8 |
| ප්‍රවාහන වියදම් | 0.6 | 0.6 | 0.8 | 0.6 | 0.7 | 1.0 | 0.8 | 0.5 | 0.2 | 0.6 |
| සැපයුම් | 0.7 | 0.9 | 1.4 | 1.2 | 1.2 | 1.5 | 1.0 | 0.8 | 0.4 | 1.0 |
| නඩත්තු | - | - | 0.7 | 0.5 | 0.6 | 0.6 | 0.4 | 0.3 | 0.2 | 0.5 |
| කොන්ත්‍රාත් සේවා | 1.7 | 2.1 | 2.2 | 2.1 | 1.8 | 2.3 | 2.1 | 1.8 | 0.8 | 1.9 |
| මාරු කිරීම් (transfers) | 3.4 | 4.3 | 4.4 | 5.0 | 4.6 | 1.8 | 0.7 | 1.2 | 7.0 | 3.6 |
| සහනාධාර | 55.1 | 38.1 | 32.9 | 42.2 | 40.2 | 24.3 | 45.7 | 60.1 | 51.2 | 43.3 |
| වෙනත් වර්තන වියදම් | 5.2 | 6.5 | 1.2 | 0.8 | 0.8 | 1.6 | 0.2 | 0.3 | 0.0 | 1.8 |
| **උප එකතුව** | **77.8** | **69.6** | **68.7** | **79.4** | **82.9** | **67.3** | **69.7** | **82.8** | **74.8** | **74.8** |
| **ප්‍රාග්ධන වියදම්** | | | | | | | | | | |
| වෙනත් වියදම් හා පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 4.7 | 8.8 | 7.6 | 7.8 | 1.0 | 4.0 | 1.4 | 0.9 | 3.1 | 4.4 |
| ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම | 11.6 | 16.6 | 17.4 | 8.5 | 4.1 | 9.0 | 9.5 | 11.7 | 5.0 | 10.4 |
| ප්‍රාග්ධන මාරු කිරීම් | 1.1 | 1.4 | 3.8 | 2.8 | 1.9 | 1.5 | 0.6 | 1.2 | 2.6 | 1.9 |
| ප්‍රාග්ධන ප්‍රදාන | 4.8 | 3.5 | 2.2 | 1.3 | - | - | - | - | - | 1.3 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | - | - | 0.1 | 0.1 | 0.0 | 2.9 | 10.3 | 3.2 | 13.9 | 3.3 |
| දායක අරමුදල් ව්‍යාපෘතිවල වියදම් (operational costs of donar funded projects) | - | - | - | - | 9.8 | 14.9 | 0.7 | - | - | 2.8 |
| **උප එකතුව** | **22.2** | **30.3** | **31.2** | **20.5** | **17.0** | **32.6** | **30.2** | **17.1** | **25.2** | **25.1** |
| **මුළු එකතුව** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |

මූලාශ්‍රය : <u>වාර්ෂික අයවැය ඇස්තමේන්තු වාර්තා</u> (1998-2006).

## 5.3 පොහොර සහනාධාරය ක්‍රියාත්මක කිරීම සඳහා දරනු ලබන වියදම

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉහළ ම වැය ශීර්ෂය වන පොහොර සහනාධාරය සඳහා වාර්ෂික ව වියදම් කර ඇති මුදල් ප්‍රමාණයන් වගු අංක 8 මඟින් දැක් වේ. මෙහි දී 2011 වර්ෂය සඳහා ඇස්තමේන්තු වියදම රුපියල් බිලියන 30 ක් වන අතර, පොහොර සහනාධාරය සඳහා රජය වාර්ෂික ව වැය කරන මුදල පිළිබඳ ව සලකා බැලීමේ දී මෙම වැඩසටහන අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගැටළුවක් මතුවේ. පොහොර සහනාධාරය යටතේ වී ගොවීන් වෙත 95% ක සහනාධාරයක් ලබා දෙයි. ලෝක වෙළෙඳපොළේ ඉතා සීඝ්‍රයෙන් ඉහළ යන පොහොර මිල සමඟ වූව ද මෙම සහනාධාරය නො වෙනස් ව පවත්වාගෙන යාමට රජය කටයුතු කරන වන අතර, ඒ හේතුවෙන් ගැටළුව වඩාත් උග්‍ර වේ.

වගු අංක 8

**පොහොර සහනාධාරය සඳහා වාර්ෂික ව වැය කර ඇති මුදල, නාමික අගය මත (2005-2008) - රු.මිලියනවලිනි.**

| විස්තරය | 2005 | 2006 | 2007 | 2008 |
|---|---|---|---|---|
| පොහොර සහනාධාරය | 6,885 | 10,700 | 11,000 | 26,854 |

මූලාශ්‍රය : මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, (2008). වාර්ෂික වාර්තාව.

වර්තමානයේ ක්‍රියාත්මක වන පොහොර සහනාධාරය නිසා ගොවීන්ට දැරීමට සිදු වන මුදල පොහොර මිටියක් මිල දී ගැනීමට රජයට වැය වන වියදමෙන් 5% ක් පමණි. පොහොර සහනාධාරය ක්‍රියාත්මක කිරීමට අදාළ ටෙන්ඩර් පටිපාටිය, ආනයනය, ගබඩා කිරීම, බෙදාහැරීම, විමර්ශනය හා අධීක්ෂණය යන සියල්ල ම සඳහා වැය වන වියදම් ද ඇතුළත් කළ හොත් පොහොර සහනාධාරය සඳහා රජයට දැරීමට සිදුවන වියදම අවම තරමින් 100% ක් ඉක්මවනු ඇත. මෙසේ අතිවිශාල මුදලක් වාර්ෂික ව දැරීමට සිදුවීම රජයට විශාල බරක් ව පවතී. එසේ ම සහනාධාරය ක්‍රියාත්මක කිරීමේ විවිධ මට්ටම්වල දී අක්‍රමිකතා සිදුවන බව ද නොරහසකි. තව ද අධික ව රසායනික පොහොර යෙදීම කෘමිනාශක භාවිතය ඉහළ යාමට හේතුවක් වන අතර, මෙවැනි ආහාර පරිභෝජනය සෞඛ්‍යයට අහිතකර ය. එසේ ම විවිධ අහිතකර පාරිසරික ප්‍රතිඵලයන් ද මේ හේතුවෙන් ඇති වේ (Gunatilake, *et al*, 2004). මෙවැනි ගැටළුකාරී වාතාවරණයක් තුළ පොහොර සහනාධාර වැඩපිළිවෙළ පිළිබඳ ව වඩාත් හොඳින් විමර්ශනය කිරීම අත්‍යවශ්‍ය වී තිබේ.

## 5.4 කෘෂි පර්යේෂණ හා ව්‍යාප්ති සේවය සඳහා වැය කළ රාජ්‍ය වියදම්

ශ්‍රී ලංකාවේ කෘෂි පර්යේෂණ කටයුතු සඳහා මධ්‍යම රජය වියදම් දරන අතර, පළාත් සභා විසින් රටේ බොහෝ ප්‍රදේශවල කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය පිළිබඳ වගකීම ගනු ලැබේ. වර්තමානයේ ආහාර බෝග නිෂ්පාදනයේ ඇති දුර්වලතාවය පිළිබඳ ව සැලකීමේ දී වඩාත් ඵලදායී සහ කාර්යක්ෂම පර්යේෂණ වැඩසටහන් හා ව්‍යාප්ති සේවයක් ඇති කිරීම කාලෝචිත ය. මේ වන විට ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා ව්‍යාප්ති සේවය දුර්වල බවත්, බලාපොරොත්තු වූ ප්‍රතිඵල පෙන්නුම් නො කරන බවත් අනාවරණය වේ.

ශ්‍රී ලංකාවේ ආහාර බෝග අංශය සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම හා ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රධාන වශයෙන් වගකීම දරනුයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යි. මේ හැරුණු විට පළාත් සභා මඟින් ප්‍රදේශය තුළ ව්‍යාප්ති සේවා කටයුතු පවත්වා ගෙන යාම සඳහා අරමුදල් සපයනු ලැබේ (මෙම අධ්‍යයනයේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාළ වියදම් පිළිබඳ ව පමණක් විශ්ලේෂණය කර ඇත).

වගු අංක 9 මඟින් හෙළිදරව් වන පරිදි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් පර්යේෂණ කටයුතු සඳහා වැය කර ඇති මුදල, ව්‍යාප්ති සේවය හා පුහුණු කිරීම් සඳහා වැය කර ඇති මුදලට වඩා වැඩි ය. කෙසේ වුව ද කෘෂි අංශයේ පර්යේෂණ සඳහා රජය විසින් වැය කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවේ. එම ප්‍රමාණය කෘෂිකර්ම අමාත්‍යාංශයේ වියදමෙන් 1.7% ක් එනම්, කෘෂිකාර්මික අංශයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.13% ක් වේ.

වගු අංක 9

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කෘෂිකාර්මික පර්යේෂණ හා ව්‍යාප්ති සේවා සඳහා වාර්ෂිකව වැය කරන මුදල (1998-2007)**

| වර්ෂය | කෘෂි පර්යේෂණ හා සංවර්ධනය සඳහා වැය කළ වියදම් (රු.මිලියන) | කෘෂි පර්යේෂණ හා සංවර්ධනය සඳහා වැය කළ වියදම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස (රු.මිලියන) | කෘෂි ව්‍යාප්තිය හා පුහුණුව සඳහා වැය කළ වියදම් (රු.මිලියන) | කෘෂි ව්‍යාප්තිය හා පුහුණු කිරීම් සඳහා වැය කළ වියදම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුළු වියදමේ % ලෙස |
|---|---|---|---|---|
| 1998 | 191.1 | 38.5 | 115.5 | 23.2 |
| 1999 | 210.0 | 27.0 | 145.9 | 18.8 |
| 2000 | 222.2 | 26.9 | 166.2 | 20.0 |
| 2001 | 262.1 | 30.4 | 187.7 | 21.8 |
| 2002 | ද.නො. | ද.නො. | ද.නො. | ද.නො. |
| 2003 | 263.2 | 36.8 | 174.9 | 24.5 |
| 2004 | 313.5 | 39.0 | 233.0 | 28.9 |
| 2005 | 415.8 | 36.0 | 317.9 | 27.6 |
| 2006 | 558.9 | 35.9 | 412.5 | 26.5 |
| 2007 | 658.3 | 21.2 | 479.7 | 15.4 |
| වාර්ෂික සාමාන්‍යය | **343.9** | | **248.1** | |

ද.නො. : දත්ත නොමැත

මූලාශ්‍රය : වාර්ෂික අයවැය ඇස්තමේන්තු වාර්තා, (1998-2009).

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ව්‍යාප්ති සේවය හා පර්යේෂණ කටයුතු සඳහා අරමුදල් සැපයීමේ දී දක්නට ලැබෙන ප්‍රධාන දුර්වලතාවයක් වන්නේ කෘෂි ව්‍යාප්ති සේවය සඳහා අරමුදල් සැපයීමේ ද්විත්ව ස්වභාවය යි. එනම්, මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා හරහා අරමුදල් ලබාදීම යි. මේ වන විට එකිනෙක අතර සම්බන්ධයක් නොමැතිව හා ප්‍රතිඵල පිළිබඳ වගවීමකින් තොරව ඇතැම් ආයතන ස්වාධීන ව ක්‍රියා කරන තත්ත්වයට පැමිණ ඇත. අරමුදල් සැපයීමේ ඇති ද්විත්ව ස්වභාවය නිසා කෘෂි පර්යේෂණ හා ව්‍යාප්ති සේවය යන අංශ දෙක අදාළ අරමුණු ඉටු නො කරන තත්ත්වයට හා ඵලදායී නො වන ප්‍රතිඵල ලබා දෙන තත්ත්වයට පත්වීමට ඉඩ ඇත. එම නිසා රට තුළ කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීමට නම් අරමුදල් සැපයීම, තාක්ෂණය භාවිතය හා ව්‍යාප්තිය පිළිබඳ ව ක්‍රමවත් විවරණයක් හා අධීක්ෂණයක් සිදු කළ යුතු ය.

මෙම අධ්‍යයනයේ දත්ත මඟින් හෙළිදරව් වන පරිදි, කෘෂි අංශයේ පර්යේෂණ හා ව්‍යාප්ති සේවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන සම්පූර්ණ අරමුදල් ප්‍රමාණය සැපයෙනුයේ රජය මඟිනි. මේ හේතුවෙන් මෙම අංශය පෞද්ගලික අංශයේ සහයෝගය හා ආයෝජනයන් වඩාත් සිදු විය යුතු, එමෙන් ම රාජ්‍ය, පෞද්ගලික අංශය හා පුද්ගල සහභාගිත්වය (Public, Private, People, Partnership - PPPs) ලැබිය යුතු ක්ෂේත්‍රයක් බවට පත් වී ඇත.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය සඳහා රාජ්‍ය අරමුදල් භාවිතයේ කාර්යක්ෂමතාවය අඩුවීම සඳහා බලපාන තවත් හේතුවක් වන්නේ, ශක්තිමත් ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් නොමැතිවීම හා අපේක්ෂා කරන අරමුණු වෙත ළඟා වීම සඳහා ඵලදායී උපාය මාර්ග භාවිතා නො කිරීම යි. පසුගිය අත්දැකීම් අනුව පෙනී යන්නේ, රටේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය ක්‍රමවත් සැලසුම් හා ඵලදායී උපායමාර්ගවලින් බැහැර ව ඇති බව යි.

## 6. කෘෂිකාර්මික අංශයේ වියදම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණ ක්‍රියාදාමයේ දී මතුවන ගැටළු

කෘෂිකාර්මික අංශයේ රාජ්‍ය වියදම් වැඩසටහනේ ජාතික මට්ටමේ කාර්යක්ෂමතාවය තීරණය වන්නේ වියදම් කරනු ලබන මුදල් ප්‍රමාණය මත පමණක් නොව, අයවැය ක්‍රියාදාමය මත ය. අයවැය ක්‍රියාදාමය තුළ (i) අයවැය සැලසුම් කිරීම (ii) වැඩසටහන ක්‍රියාත්මක කිරීම (iii) අධීක්ෂණය හා ඇගයීම (M&E) (iv) වැඩසටහන් පසු ඇගයීම හා ප්‍රතිඵල විමර්ශනය (v) අධීක්ෂණය හා ඇගයීම සඳහා රජය විසින් ඵලදායී ප්‍රතිචාර යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම අඩංගු වේ.

මෙම කොටසින් රාජ්‍ය වියදම් ක්‍රියාවලියේ එක් එක් ප්‍රධාන පියවරයන් පිළිබඳ ව විමර්ශනය කරයි. මෙහි මූලික අරමුණ මෙම ක්‍රියාවලියේ ප්‍රතිඵලයට බලපාන ප්‍රධාන කරුණු, ගැටළු හා බාධක හඳුනා ගැනීම ය.

### 6.1 කෘෂිකාර්මික අංශයේ රාජ්‍ය වියදම් සැලසුම්කරණය

කෘෂිකාර්මික අංශයේ අයවැය සැලසුම් කිරීමේ ක්‍රියාවලිය තුළින් බලාපොරොත්තු වන්නේ කෘෂිකර්ම සංවර්ධනය පිළිබඳ ව වන රජයේ දැක්ම පිළිබඳ ආර්ථික අරමුණු සාක්ෂාත් කරගැනීම ය. අයවැය සැලසුම් කිරීමේ දී විනිවිදභාවය, සාධාරණත්වය, තිරසාර හා ආයෝජන සඳහා වගවීම යන කරුණු සහතික විය යුතු ය. කෙසේ වුව ද කෘෂිකර්ම අංශයේ රාජ්‍ය වියදම් සැලසුම්කරණය පිළිබඳ සැලකීමේ දී සත්‍ය වශයෙන් ම අනුගමනය කරන ක්‍රියාදාමය අපේක්ෂිත ක්‍රියාවලියෙන් විශාල වශයෙන් බැහැර වී ඇති බව පෙනී යයි.

පසුගිය කෘෂි සංවර්ධන සැලසුම් පිළිබඳ ව විමසීමේ දී පෙනී යන්නේ ඒ සඳහා පැහැදිලි, ඵලදායී, දීර්ඝකාලීන දැක්මක් හා නියච්ත ප්‍රතිපත්තිමය වැඩසටහනක් නොමැති බව යි. කෘෂිකර්ම අංශයේ විශේෂයෙන් ආහාර බෝග ක්ෂේත්‍රයේ සැලසුම් හා උපායමාර්ගවලින් පිළිබඳ ව සැලකීමේ දී බොහෝ ආයතන විසින් කෙටිකාලීන ගැටළු සහ වෙනස්වීම් පිළිබඳ පමණක් සලකන බව පෙනේ. සමස්තයක් ලෙස සැලකීමේ දී එම සැලසුම්, ඵලදායී උපායමාර්ගවලින් බැහැර ව ඇති බවත්, තිරසාර ප්‍රතිඵල වෙත ළඟාවීමට අසමත් ව ඇති බවත්, මෙම සැලසුම් සැකසීමේ දී අතීත අත්දැකීම්වලින් ප්‍රයෝජන ගැනීම අඩු බවත් දැකිය හැක.

මෙම අංශයේ ඇති තවත් ප්‍රධාන ගැටළුවක් වන්නේ, කෘෂිකාර්මික අංශයට සම්බන්ධ අමාත්‍යාංශ අතර වඩාත් හොඳ සැලසුම්කරණයක් නො තිබීමත් අධීක්ෂණය හා ඇගයීම සඳහා වන ආයතනික ව්‍යුහයන් දුර්වල වීමත් ය. එසේ ම ප්‍රධාන සංවර්ධන කරුණු හා ප්‍රශ්න පිළිබඳ ව වඩාත් හොඳ හා නිවැරදි පර්යේෂණ තොරතුරු නොමැති වීම, තිරසාර ඵලදායී නව සංවර්ධන විකල්පයන් සැකසීම සඳහා ආයතනික රාමුව දුර්වල වීම, දැනට පවතින හා නිම කරන ලද කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාවලීන් පිළිබඳ ව ප්‍රමාණවත් හා ගුණාත්මක ඇගයීමක් සිදු කර නො තිබීම ආදිය මෙම අංශයේ වියදම් සැලසුම්කරණය විධිමත් කිරීම සඳහා පවතින බාධක වේ.

කෘෂිකර්ම අංශයට සම්බන්ධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විශාල ප්‍රමාණයක් පැවතීම මෙම අංශයේ වියදම් සැලසුම් සකස් කිරීමේ දී ගැටළුවක් ව පවතී. එසේ ම විෂය පථයන් හා වගකීම් වරින්වර වෙනස්වීම හා අමාත්‍යාංශවල කාර්යභාරය එකිනෙක අතිපිහිත (overlap) වීම ප්‍රධාන ගැටළුවකි. මෙසේ එක් අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක කාර්යභාරය තවත් අමාත්‍යාංශයක වැඩසටහන් ක්‍රියාදාමයේ ද ඇතුළත් ව තිබීම නිසා වියදම් පාලනය අකාර්යක්ෂම වී ඇති අතර, සම්බන්ධීකරණය අපහසු වීම හා කළමනාකරණයේ ගැටළු මතු වී තිබේ.

ආයතනික ව්‍යුහයේ පවතින දුර්වලතාවය නිසා, කෘෂිකාර්මික අංශයේ සංවර්ධන සැලසුම් පිළිබඳ තීරණ ගැනීම නිරන්තර ව ඉහළ මට්ටම්වල දී සිදුවන අතර, එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා පහළ මට්ටම්වලට යොමු කෙරේ. පසුගිය අත්දැකීම් මඟින් පැහැදිලි වන්නේ මෙම කාලය තුළ සකස් කරන ලද ප්‍රතිපත්ති වැඩසටහන් බොහොමයක් දුර්වල, තාර්කික නො වන හා ශක්තිමත් ප්‍රකාශන මත සකස් නො කරන ලද ඒවා බව යි. මෙම තත්ත්වය යටතේ කෘෂිකාර්මික අංශයේ රාජ්‍ය අයවැය සැලසුම්කරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා වඩාත් අවධානය යොමු විය යුතු ය.

## 6.2 අයවැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

දේශීය කෘෂිකාර්මික අංශයේ වියදම් වැඩසටහන්වල විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී ඇති දුර්වලතාවය, කෘෂි අංශයේ අයවැය වැඩසටහන්වල ප්‍රතිඵල දුර්වල කිරීමට ප්‍රධාන වශයෙන් හේතු වේ. ශ්‍රී ලංකාව තුළ විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන බොහෝ වැඩසටහන්වල මෙම තත්ත්වය වැඩි වශයෙන් දැකිය හැකි ය. අයවැයෙන් ඇස්තමේන්තු කළ මුදල් අඩුවෙන් වියදම් කිරීම, සැලසුම් කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්, ප්‍රතිඵල සඳහා වගවීම අඩු බව ආදිය දැකිය හැකි දුර්වලතාවයන් ය. සංවර්ධන වැඩසටහන්වල සාර්ථකත්වය මැනීම, වියදම් කරන ලද මුදල් ප්‍රමාණය මත ම පමණක් සිදු කිරීමත්, එයින් අත්පත් කරගන්නා ලද සත්‍ය ප්‍රතිඵල පිළිබඳ සොයා නො බැලීමත් රාජ්‍ය අංශයේ වියදම් ක්‍රියාවලිය දුර්වල වීමට හේතු වී ඇත.

## 6.3 ප්‍රතිඵල මූල් කරගත් වියදම් වැඩසටහන් අධීක්ෂණය හා ඇගයීම

කෘෂිකාර්මික අංශයේ අරමුදල් භාවිතයේ කාර්යක්ෂමතාවය ඇගයීම මෙන් ම වියදම් වැඩසටහන්වල කාර්යක්ෂමතාව ඇගයීම සඳහා විධිමත් අධීක්ෂණ හා ඇගයීම් වැඩසටහන් නොමැති වීම ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ වියදම් වැඩසටහන්වල සමස්ත ඵලදායීත්වය අඩු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වේ. මෙසේ විධිමත් අධීක්ෂණයක් ක්‍රියාත්මක නො වීමට බලපාන හේතු නම් කාර්යක්ෂම අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමවේදයක් තුළින් සිදුවන ප්‍රයෝජනය පිළිබඳ අදාළ ආයතන නිසි පරිදි හඳුනා නො ගැනීම, ප්‍රායෝගික ව එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ධාරිතාවයක් බොහෝ අමාත්‍යාංශ සතුව නො තිබීම ආදිය යි. එසේ ම කෘෂිකාර්මික අංශයේ වියදම් වැඩසටහන්වලින් මතුවන ප්‍රතිඵල ඇගයීම සඳහා පසු ඇගයීම් ක්‍රමවේදයක් නොමැති බව අධ්‍යයනයේ දී අනාවරණය වූ අතර, මෙය වඩාත් අවධානයට ලක්විය යුත්තකි.

## 6.4 ශ්‍රී ලංකාවේ අයවැය ක්‍රියාවලිය ඇගයීම : සාරාංශය

තෝරාගත් දර්ශක උපයෝගී කරගනිමින් ආහාර බෝග අංශයේ රාජ්‍ය වියදම් වැඩසටහන්/ ව්‍යාපෘතිවල සමස්ත කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා ආකෘතියක් සකස් කිරීම මෙහි දී සිදු කරනු ලැබේ. ඒ සඳහා භාවිතා කරන ලද දර්ශක වනුයේ (i) සංවර්ධන සැලසුම් වැඩසටහන්වල ගුණාත්මක බව සහ ව්‍යාපෘති සැකසීමේ දී යෝජනා කරන ලද උපායමාර්ග (ii) ව්‍යාපෘති අයවැය වැඩසටහන්වල අඩංගු තොරතුරු සහ මූල්‍යමය තොරතුරුවල විනිවිදභාවය (iii) වැඩසටහන්වල ඵලදායීත්වය (iv) ව්‍යාපෘතිවලින් අත්පත් කරගත් ප්‍රතිඵල සඳහා වගවීම (v) වියදම් වැඩසටහන් අධීක්ෂණය හා ඇගයීම සඳහා ඇති අභ්‍යන්තර ධාරිතාවය යනාදිය යි.

මෙම අධ්‍යයනයේ තොරතුරු අනුව පැහැදිලි වන්නේ, කෘෂිකාර්මික අංශයේ වියදම් වැඩසටහන්වල කාර්යක්ෂමතාවය දුර්වල බව යි. ව්‍යාපෘති සංවර්ධන අභිමතාර්ථයන් පිළිබඳ දැනුවත්බව අඩුකම සහ අයවැය ක්‍රියාවලියේ පහළ මට්ටම්වල දී එහි නීතිරීති හා කරුණුවලට අනුකූල වීම

ප්‍රමාණවත් නො වීම, ආදිය මෙම දුර්වලතා දැකිය හැකි අවස්ථා වේ. එම නිසා මෙම තොරතුරු මඟින් පැහැදිලි වන්නේ අයවැය සැලසුම් කිරීමේ රාජ්‍ය අංශයේ සියළු ම මට්ටම්වල දී අදාළ නීතිරීති හා කාලරාමුවලට තදින් අනුගත වීම අවශ්‍ය බව යි. කෙසේ වුව ද බොහෝ වැඩසටහන්වල දී අඩුම අවධානයක් යොමුකර ඇත්තේ වැඩසටහන් අධීක්ෂණය, ඇගයීම සහ ප්‍රතිඵල පසු ඇගයීම් සඳහා ය.

කෘෂිකාර්මික අංශයේ රාජ්‍ය වියදම් වැඩසටහන්වල කාර්යක්ෂමතාව ඇගයීම සඳහා යොදා ගන්නා දර්ශක හා ඒ අනුව එක් එක් මට්ටම්වල කාර්යක්ෂමතා වගු අංක 10 න් දැක්වේ. මේ අනුව පෙනී යන්නේ අයවැය සකස් කිරීමේ ඉහළ මට්ටම්වල දී අයවැය වෙන් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම් ක්‍රියාවලිය අකුරට ම ඉටු වන බව යි. කෙසේ වුව ද, පහළ මට්ටම්වල දී මෙහි කාර්යක්ෂමතාවය හා ඵලදායීත්වය අඩු වී තිබේ. මෙය අයවැය සැලසුම් කරන්නන් විසින් වඩාත් අවධානයට ලක් කළ යුත්තකි. වියදම් වැඩසටහන් / ව්‍යාපෘතිවල අරමුණු සහ උපාය මාර්ගයන් පිළිබඳ පහළ මට්ටම්වල දැනුවත්භාවය වැඩිදියුණු කිරීම, අයවැය වැඩසටහන් අධීක්ෂණය හා ඇගයීම් සඳහා වඩාත් ඵලදායී ආයතනික රාමුවක් තෝරා ගැනීම මඟින් මෙම වියදම් වැඩසටහන් වඩාත් කාර්යක්ෂම කරගත හැකි ය.

වගු අංක 10

**අයවැය ක්‍රියාදාමයේ රාජ්‍ය වියදම් වැඩසටහන්වල කාර්යක්ෂමතාවය ඇගයීම හා සන්සන්දනය සඳහා ආකෘතියක්**

| කරුණු | වියදම් ක්‍රියාවලිය (පළමු මට්ටම - භාණ්ඩාගාර) | වියදම් ක්‍රියාවලිය (දෙවැනි මට්ටම - අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු) | වියදම් ක්‍රියාවලිය (තෙවැනි මට්ටම - ක්ෂේත්‍ර මට්ටම) |
|---|---|---|---|
| 01. සංවර්ධන සැලසුම් වැඩසටහන්වල ගුණාත්මක බව සහ ව්‍යාපෘති සැකසීමේ දී යෝජනා කරන ලද උපායමාර්ග | ඉහළ | මධ්‍යම | අවම |
| 02. ව්‍යාපෘති අයවැය වැඩසටහන්වල අඩංගු තොරතුරු සහ මූල්‍යමය තොරතුරුවල විනිවිදභාවය | ඉහළ | මධ්‍යම | අවම |
| 03. වැඩසටහන්වල ඵලදායීත්වය | ඉහළ | මධ්‍යම | අවම |
| 04. ව්‍යාපෘතිවලින් අත්පත් කරගත් ප්‍රතිඵල සඳහා වගවීම | ඉහළ | මධ්‍යම | අවම |
| 05. වියදම් වැඩසටහන් අධීක්ෂණය හා ඇගයීම සඳහා ඇති අභ්‍යන්තර ධාරිතාවය | හොඳයි | දුර්වලයි | ඉතා දුර්වලයි |

## 7. නිගමන

මෙම කොටසින් අධ්‍යයනයේ සොයා ගැනීම් පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කරන අතර, මෙය කොටස් දෙකකින් විස්තර වේ. අයවැය සඳහා මුදල් වෙන් කිරීම හා එහි යෙදවීම් පිළිබඳ කරුණු පළමු කොටසින් ද කෘෂිකාර්මික අංශයේ අයවැය ක්‍රියාවලිය හා සම්බන්ධ කරුණු දෙවැනි කොටසින් ද සංක්ෂිප්ත කර දැක්වේ.

## 7.1 අයවැය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම

01. දේශීය කෘෂි අංශය, සඳහා අඩු ප්‍රමුඛත්වයක් ලබාදීම;

දේශීය කෘෂි අංශය, ශ්‍රී ලංකාවේ සීඝ්‍රයෙන් නාගරීකරණය වන ජනගහනය සඳහා අවශ්‍ය වන ආහාර සැපයීම අතිනුත්, ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා උපකාරී වන රැකියා අවස්ථා නිර්මාණය කිරීම අතිනුත් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබ යි. කෙසේ වුව ද මෙම අධ්‍යයනය මඟින් හෙළිදරව් වන පරිදි, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය සඳහා 1998-2009 කාලය තුළ වැය කර ඇති රාජ්‍ය වියදම සමස්ත රාජ්‍ය වියදමෙන් 4% ක් පමණි. එසේ ම එය පසුගිය කාල වකවානුව තුළ ඉහළ වර්ධනයක් පෙන්වා නැත. පශු සම්පත් සඳහා අවම ප්‍රමුඛත්වයක් ලබා දී ඇති අතර, ඒ සඳහා වාර්ෂික ව යෙදවෙන මුදල කෘෂිකර්මය සඳහා වන මුළු රාජ්‍ය වියදමෙන් 1% ක් පමණි. 1998 සිට 2003 දක්වා කාලය තුළ කෘෂිකර්මය සඳහා යොදවා ඇති රාජ්‍ය වියදමේ අඩු වීමක් දක්නට ලැබේ.

කෙසේ වුව ද අයවැය සඳහා වෙන් කරන මුදල ඉහළ නැංවීම තුළින් පමණක් ම කෘෂි ක්ෂේත්‍රයේ ඉහළ සංවර්ධනයක් ඇති වේ යැයි බලාපොරොත්තු විය නො හැකි අතර, අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධ වෙනත් ප්‍රධාන කරුණු ද එමඟින් අපේක්ෂිත ප්‍රතිඵල දුර්වල කිරීමට බලපායි. එම නිසා අයවැය වෙන් කිරීමේ දී අරමුදල් ප්‍රමාණය ඉහළ නැංවීමට පෙර එම ක්‍රියාවලිය හා සම්බන්ධ කරුණු පිළිබඳ ප්‍රවේශමෙන් අධ්‍යයනය කළ යුතු ය.

02. කෘෂිකාර්මික අංශයේ සෘජු සහනාධාර සඳහා වැය කරන වියදම;

කෘෂිකාර්මික අංශය තුළ සෘජු හා වක්‍ර සහනාධාර වැඩසටහන් ගණනාවක් ඇති අතර වී පොහොර සහනාධාරය ඉන් විශාලතම සහනාධාරය යි. ඒ සඳහා විශාල රාජ්‍ය වියදමක් ද දැරීමට සිදු වී තිබේ (2010 සඳහා ඇස්තමේන්තු කළ මුදල රුපියල් බිලියන 30 කි). මෙය තිරසාර වැඩපිළිවෙළක් ද යන්න ප්‍රශ්නාර්ථයකි. මෙම පොහොර සහනාධාරයට අමතර ව රජය විසින් කෘෂි අංශය සඳහා සේවා වශයෙන් මෙන් ම ද්‍රව්‍ය වශයෙන් ද සහනාධාර ලබාදීමක් සිදු කරයි. එසේ ම පළාත් මට්ටමින් ද කෘෂිකාර්මික අංශය සඳහා ගොවීන්ට විවිධ යෙදවුම් හා සේවා සඳහා අවශ්‍ය සහනාධාර ලබාදෙයි. නමුත් මෙවැනි කෘෂි ක්ෂේත්‍රයට සම්බන්ධ සහනාධාර වැඩසටහන් හෝ ඒවාට සම්බන්ධ මුළු රාජ්‍ය වියදම් පිළිබඳ ව හෝ එම වැඩසටහන්වල දීර්ඝකාලීන තිරසාර බව පිළිබඳ ව අධ්‍යයනයන් මෙතෙක් සිදුවී නොමැත. එසේ ම මෙම පොහොර සහනාධාරය මූල්‍යමය, ආයතනික හා පාරිසරික වශයෙන් ගැටළු රාශියකට හේතු වේ.

03. රාජ්‍ය සේවකයින්ගේ වැටුප් සඳහා වර්තන වියදමෙන් ඉහළ ප්‍රතිශතයක් වැයවීම;

කෘෂිකර්ම අමාත්‍යාංශයේ දෙවන වැඩි ම වැය ශීර්ෂය වන්නේ සේවක වැටුප් හා අනෙකුත් දීමනා සඳහා වැය කරන මුදල යි. මේ හේතුවෙන් නව ක්‍රියාමාර්ග/ව්‍යාපෘති හඳුන්වා දීමට හෝ කෘෂි අංශයේ දියුණුව සඳහා යෙදවීමට ඇති මුදල් ප්‍රමාණය අඩු වේ. මෙම අධ්‍යයනයේ තොරතුරු අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය තුළ අයවැයෙන් 22% ක් ම වැටුප් සඳහා වැයවේ.

04. ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තු මුදල් අඩුවෙන් වියදම් කිරීම;

මෙම අධ්‍යයනයේ දත්ත මඟින් පැහැදිලි වන්නේ වර්ෂය මුල දී ඇස්තමේන්තු කරන මුදල වර්ෂය අවසන් වන විට වියදම් කිරීමට අසමත් ව ඇති බව ය. මෙය විශාල වශයෙන්

අවධානයට ලක්විය යුත්තකි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ, අදාළ දෙපාර්තමේන්තු හෝ ආයතන මගින් බලාපොරොත්තු වන ප්‍රමාණයට වැඩියෙන් වියදම් ඇස්තමේන්තු සකස් කිරීමත්, අමාත්‍යාංශවලට නව ප්‍රාග්ධන ආයෝජන වැඩපිළිවෙළ ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පවතින දුර්වලතාත් ය. වර්ෂය ආරම්භයේ දී අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හෝ ආයතන මගින් නිසි පරිදි ප්‍රාග්ධන වැඩ සැළසුම් කිරීමට නො හැකි වීම නිසා වර්ෂය අවසානයේ දී එම ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කරන ලද මුදල් වියදම් කිරීම පිළිබඳ ගැටළු මතු වේ.

05. කෘෂිකාර්මික පර්යේෂණ හා ව්‍යාප්තිය;

පර්යේෂණ අංශයේ හා ව්‍යාප්ති සේවයේ පවතින ගැටළු කිහිපයක් මෙම අධ්‍යයනය මගින් හඳුනා ගත හැක. මෙම ගැටළු වඩාත් උග්‍ර වන්නේ දීර්ඝකාලීන දැක්මක් හා ඵලදායී උපායමාර්ග සහිත ස්ථිර කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් නොමැති නිසාවෙනි. කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්තිය සඳහා ප්‍රමාණවත් මුදලක් අයවැයෙන් වෙන් නො කෙරේ. ජාතික කෘෂි ව්‍යාප්ති සේවය සඳහා මධ්‍යම රජයෙන් හා පළාත් සභා යන දෙක ම මගින් අරමුදල් සැපයේ. පර්යේෂණ සඳහා රජය මගින් පමණක් අරමුදල් සැපයේ. මෙසේ අරමුදල් සැපයීමේ දී, ආයතනික ද්විත්වභාවයක් පැවතීම තාක්ෂණික දැනුම ජනනය කිරීම හා ව්‍යාප්ති සේවය අකාර්යක්ෂම වීමට බලපාන ප්‍රධාන හේතුවක් වේ.

## 7.2 අයවැය ක්‍රියාවලිය සම්බන්ධ කරුණු

01. කෘෂිකාර්මික අංශය සඳහා වැය කරන අරමුදල් ප්‍රමාණවත් නො වීම;

කෘෂිකර්මය සඳහා ප්‍රමාණවත් තරම් රාජ්‍ය ආයෝජනයක් නොමැති වීම මෙම අධ්‍යයනය මගින් හෙළිදරව් වන ප්‍රබල ගැටළුවකි. මේ සඳහා විසඳුමක් ලෙස අතීතයේ දී විශාල වශයෙන් අරමුදල් සැපයීම (උදාː පර්යේෂණ ව්‍යාප්ති සේවා හා අලෙවිය) ආදිය සිදු කර තිබේ. මෙයින් උපකල්පනය කරන ලද්දේ අරමුදල් සැපයීම නිසා ස්වාධීන ව එය නිවැරදි වන බවත්, ඒ තුළින් ප්‍රතිඵල ලබා ගත හැකි බවත් ය. නමුත් කෘෂිකර්ම අංශය දෙස බැලූ විට මේ දක්වා ම එම අදහස අසාර්ථක වී ඇති බව පෙනේ.

02. අමාත්‍යාංශ සහ රේඛීය ආයතන මට්ටමේ ධාරිතාවය සීමිත වීම;

ශ්‍රී ලංකාවේ වාර්ෂික අයවැය ක්‍රියාත්මක කිරීම විවිධ පරිපාලන මට්ටම් 3 ක දී සිදුවේ. පහළට පැමිණීමත් සමඟ මේවායේ කාර්යක්ෂමතාවය දුර්වල වේ. ඉහළ ම මට්ටමේ දී එනම්, භාණ්ඩාගාර මට්ටමේ දී අයවැය සැකසුම් ක්‍රියාවලිය ඉතා ඉහළ වගවීමක්, විනිවිද භාවයක්, සැළසුම්කරණයක් හා අධීක්ෂණයක් ඇති ව සිදු වේ. මධ්‍යම මට්ටමේ දී එනම්, අමාත්‍යාංශ මට්ටමේ දී ක්‍රියාවලියේ ශක්තිමත් බව අඩු වන අතර, බිම් මට්ටමේ දී මෙම ක්‍රියාවලිය තවදුරටත් දුර්වල වේ.

03. ආයතනික කරුණු;

කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන අතර පවතින සම්බන්ධතාවය දුර්වල වීම මෙම අංශයේ කාර්යක්ෂමතාවය දුර්වල වීමට ප්‍රධාන හේතුවකි. කෘෂිකර්ම අංශය හා සම්බන්ධ අමාත්‍යාංශ විශාල සංඛ්‍යාවක් පැවැතීමත්, ඒවායේ නිරතුරු ව සිදුවන අක්‍රමික වෙනස්වීම් මෙම අංශයේ ප්‍රතිඵල කෙරෙහි ලඟා වීමට ගැටළුවක් ව පවතී.

05. පෞද්ගලික අංශයේ සම්පත් දායකත්වය ඉහළ නැංවීම;

මෙම අධ්‍යයනය මඟින් පැහැදිලි වන ප්‍රධාන කරුණක් වන්නේ රාජ්‍ය වියදම් වැඩසටහන් සැලසුම් කිරීමේ දී පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ඒකාබද්ධ වීම හා සහයෝගය ලබා ගැනීමට සැලකිල්ලක් දැක්විය යුතු බව යි. පෞද්ගලික අංශයේ මැදිහත්වීම ලබා ගැනීම මඟින් කෘෂි අංශයට විශාල වශයෙන් ප්‍රතිලාභ අත්පත් කරගත හැක. එමඟින් කෘෂි ක්ෂේත්‍රයේ මුළු සම්පත් පරිමාව ඉහළ නැංවෙන අතර, රාජ්‍ය හා පෞද්ගලික අංශය අතර තරඟකාරිත්වය වැඩිවීම කෘෂිකාර්මික අංශයේ ඵලදායිත්වය ඉහළ නැංවීමට උපකාරී වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. Asian Productivity Organization, (1987). Public Expenditures on Agriculture in Asia, Report of APO Seminar. Tokyo, Japan.
2. Blarcom, B.V., Knudsen, O., and Nash, J., (1993). The Reform of Public Expenditure for Agriculture. World Bank, Washington D.C.
3. Central Bank of Sri Lanka, (1998-2009). Annual Reports. Colombo.
4. Fan, S. and Pardey, P.G. (1998). 'Government Spending on Asian Agriculture: Trends and Production Consequences'. Chapter 3 in Agricultural Public Finance Policy in Asia. Asian Productivity Organization. Tokyo, Japan.
5. Fan, S., Hazell, P., and Thorat S., (1999). Linkages Between Government Spending, Growth and Poverty in Rural India. International Food Policy Research Institute, Washington, D.C.
6. Fan, S., Zhang, X., and Rao, N., (2004). Public Expenditures, Growth and Poverty Reduction in Rural Uganda. International Food Policy Research Institute. Washington, D.C.
7. Fan, S., (2008). Public Expenditures, Growth and Poverty: Lessons from Developing Countries. International Food Policy Research Institute, Washington, D.C.
8. Gunatilake, J and Gunatilake, S. (2004). Polution of Drinking Water by Application of Nitrate Fertilizers-A Case Study from Kandy. Symposium Proceedings of the Water Professional's day. Water Resources Research in Sri Lanka, Post Graduate Institute of Agriculture, Peradeniya.
9. Kherallah, M., and Goletti, F., (2000). Vietnam- Public Expenditure Review: Input on the Agricultural and Rural Sectors. International Food Policy Research Institute, Washington, D.C.
10. Ministry of Finance and Planning Sri Lanka, (1998-2009). Annual Budget Estimates. Colombo.
11. ........... (2009). Public Expenditure Review of Food Crop Sector in Sri Lanka; 1998-2007. M.Econ Thesis (Unpublished). University of Colombo.
12. Peoples Bank, (January/ March 2008). Economic Review-Budget 2008. Colombo.